# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 71 — 1973 අගෝස්තු 03 වැනි සිකුරාදා — 1973.08.03

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 977 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... | 993 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 989 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... | 989 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — | විවිධ දැන්වීම් ... | — |


සැලකිය යුතුයි.—(i) මග්ගොන තරුණ බෞද්ධ සංගම් පනත් කෙටුම් පත් සහ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් 29 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ ශ්‍රී ලංකා පලතුරු මණ්ඩල පනත 1973 අගෝස්තු මස 03 දින ශ්‍රී විශයෙන් පළ වේ. පනත් කෙටුම්පත, ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගම් පනත් (නීතිගත කිරීමේ) පනත් කෙටුම්පත 1973 ජූලි මස 20 දින ශ්‍රී වශයෙන් පළ කරන ලදී. (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 30 දරන ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

අනුපිටපත් කිරීමේ ඉටිකඩදාසි හා නිවැරදි කිරීමේ ද්‍රව සැපයීමේ ටෙන්ඩරය.

ඉහත සඳහන් සැපයීම සඳහා 1973. 06. 01 දින, අංක 62 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය මගින්, කරන ලද ටෙන්ඩර් කැඳවීම පිළිබඳ දැන්වීම අවලංගු කළ බව කරුණාවෙන් සලකන්න.

සැ. ඔ. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973. 08. 03 දින,
කොළඹ දීය.

7-63—73. 08. 03 දින අංක 71 දරන ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කොළඹ 5, නාරාහේන්පිට, නාවලපාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය කොළඹ 5, නාරාහේන්පිට වැඩපල හා යාන්ත්‍රාගාරයට ගෙනවිත් භාරදීම සඳහා 1973 අගෝස්තු මස 15 වැනි දින දවස 3 දක්වා ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

#### ඇසටෙලින් බෝතල් 5. (හිස්)

විස්තර—

දියකරන ලද ඇසටෙලින් පිරවීම සඳහා පාස්සපු බෝතල් අවශ්‍යය. වර්ග අඟලකට රාත්තල් 200 ක පමණ වායුපීඩණයක් ඉසිලීමට ශක්ති ඇත්ද, අඩු වශයෙන් වායු ඝන අඩි 100 ක් පිරවීමට ඉඩකඩ තිබිය යුතුය. දිග අඟල් 36 ක් පමණ විය යුතුය. ප්‍රවේසම් සහිත මුඩි සහ වැල්ව් වලින් සම්පූර්ණ විය යුතුය. මෙම බෝතල් පිළිගත් ප්‍රමිත යන්ට සෑම අතින්ම සම්පූර්ණයෙන් සම්මත විය යුතුය.

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ "ඇසටෙලින් හිස් බෝතල්" යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5, නාරාහේන්පිට නාවලපාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්න කිරීමකින් තොරව ටෙන්ඩර් පත් පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම හෝ පිළි නොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර්පත් දෙපිටපතකින් යුතුව එවිය යුතුය.

ජේ. කේ. ඊ. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපල හා යාන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728, කොළඹ 5,
1973. 7. 19.

7-64—73. 08. 03 දින අංක 71 දරන ගැසට් පත්‍රය

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයන් පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කොළඹ 5, නාරාහේන්පිට නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය කොළඹ 5, නාරාහේන්පිට වැඩපල හා යාන්ත්‍රාගාරයට ගෙනවිත් භාරදීම සඳහා 1973 අගෝස්තු 15 දින සවස 3 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ඔක්සිජන් වායුව පිරවීම සඳහා හිස් බෝතල් 6 (හයයි)

ප්‍රමිත—

පෑස්සුම් සඳහා භාවිතා කරණ වානිජ ඔක්සිජන් වායු පිරවීම සඳහා මැන්ගනිස් වානේ ලෝහයෙන් සාදන ලද බෝතල් වර්ග අඟලකට රාත්තල් 2,000 ක වායු පීඩනයක් ඉසිලීමට ශක්තියක්ද අඩු වශයෙන් වායු ඝන ඝන අඩි 200 පිරවීමට ඉඩ කඩද තිබිය යුතුය. දිග අඟල් 50 ක් පමණ විය යුතුය. ප්‍රවේසම් සහිත මූඩි සහ වැල්ව් වලින් සම්පූර්ණ විය යුතුය. මෙම බෝතල් පිළිගත් ප්‍රමිතයන්ට සෑම අතින්ම සම්පූර්ණ විය යුතුය.

ඉහත ප්‍රමිත ගත්ගෙන් යම් වෙනස්වීම් ඇතොත් එය ටෙන්ඩර් පතෙහි සඳහන් කළ යුතුය.

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ "ඔක්සිජන් වායු පිරවීම සඳහා බෝතල්" යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5, නාරාහේන්පිට නාවල පාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්න කිරීමකින් තොරව ටෙන්ඩර් පත් පිළි ගැනීම හෝ කොට සත් පිළිගැනීමේ හෝ පිළි නොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර් පත් දෙපිටපතකින් යුතුව එවිය යුතුය.

ජේ. කේ. ටී. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපල හා යාන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728, කොළඹ 5.
1973. 7. 19.

7–65—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973 අගෝස්තු මස 31 වෙනි දින පස්වරු 2 දක්වා කොළඹ තැ. පෙ. 500 ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල—රුපියල් |
|---|---|
| (1) දේවනුව ගොවි ජනපදයේ බුදුගේ හින්න පන්සල පාර සිට විද්‍යාලය දක්වා පාර ... | 50,000 |
| (2) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් සේවක මුගතුන්ට විවේකාගාරය, අනුරාධපුරය ... | 30,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ට 1973 අගෝස්තු 27 වෙනි දින පස්වරු 1 තෙක් අනුරාධපුර කච්චේරියේ ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් අදාල වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් අනුරාධපුර කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් අනුරාධපුර දිසාපති වෙත ඉදිරිපත් කල විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවනු කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපැලෙන් නොඑවන්නේ නම් ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1973 සැප්තැම්බර් මස 03 වෙනි දින ප.ව. 2 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුනාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ කරවා ගැනීමට, පුහුණු නොපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර ඔවුන් පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත් කරු යම් විදියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට අළඹෙන නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලිය විල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කරන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරන වූද, කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි අනුකූල වූද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, පෙරෙට්ටු පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු අනුරාධපුර දිසාපතිගෙන් දැනගත හැකිය.

පී. බී. චන්නිනායක,
උප දිසාපති,
අනුරාධපුර දිසාපති වෙනුවට.

1973 ජූලි මස 20 වෙනි දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේ දිය.

7–35—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

හිඟුරක්ගොඩ රජයේ ගොවිපලට ඉදුණු කොහු අඹ ඇට සැපයීම

**1973/1974 මහ කන්නය**

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් ගොවිපලට අවශ්‍ය හොඳට පැසුණු පැල කිරීමට සුදුසු කොහු අඹ ඇට සැපයීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්‍ර 1973. 8. 23 දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

ඒ අඹ ප්‍රමාණය පහත සඳහන් මාස වලදී ඒ ගොවිපලට සැපයිය යුතුවේ.

ගොවිපල : හිඟුරක්ගොඩ රජයේ ගොවිපල : අවශ්‍ය අඹඇට ප්‍රමාණය : 1,20.000 ; සැපයිය යුතු මාස : 1973 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා (මසකට 40,000 බැගින්).

ටෙන්ඩර්කරු විසින් සපයනු ලබන අඹවලට මුදල් ගෙවනු ලබන්නේ අඹ භාරදුන් පසු ඒවා කපා පරීක්ෂා කිරීමෙන් පසුය. පැල

2. දනට මෙම ද්‍රව්‍යයන් ගබඩාවල නොමැති නම් ආනයනයකර සැපයීමට ද ඉල්ලුම් කල හැක. ටෙන්ඩර්කරුවන් විසින් ණයවර ලිපි විවෘතකල යුතු අතර, බඩු ඉවත් කිරීමද ඔහු විසින්ම කළ යුතුය.

3. මෙම සියලුම ද්‍රව්‍යයන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හෝ එහි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරණ ලද නියම තත්වයන් අනුව තිබිය යුතුය. 1973.09.10 වැනි දින හෝ ඊට පෙර මෙම ද්‍රව්‍යයන් සැපයිය යුතුය.

4. ටෙන්ඩර් කරුවන්ට මින් කොටසකට හෝ සම්පූර්ණයෙන්ම හෝ ටෙන්ඩර් කළ හැකිය.

5. දෙපිටපතින් සකස් කරණ ලද මිළ ගණන් සඳහන් ලැයිස්තු හොඳින් මුද්‍රා තබන ලද කවරයක බහා " ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම හා ගෙනගොස් බාරදීම සඳහා මිලගණන් " යන්න කවරයේ පිට පැත්තේ සඳහන් කර සභාපති, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඉංජිනේරු අංශය, ගන්නොරුව, පේරාදෙණිය යන ලිපිනයට 1973, සැප්තැම්බර් මස 06 වැනි දින ප.ව. 2.30 ට පෙර ලැබෙන සේ එවිය යුතුය.

6. සියළුම මිළ ගණන් ටෙන්ඩර් අවසාන කරන ලද දිනයේ සිට දින 40ක කාලයක් තුල භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

7. ටෙන්ඩර් සියල්ල හෝ ඉන් කොටසක් හෝ භාරගැනීමේ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

8. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර, පේරාදෙණියේ, ගන්නොරුවේ කෘෂිකර්ම ඉංජිනේරු (සිවිල්) තැනගෙන් ලබාගත හැක.

එස්. කනේසු,
ප්‍රධාන ඉංජිනේරු වෙනුවට.

කෘෂිකර්ම ඉංජිනේරු අංශය,
යාන්ත්‍රික වැඩපල,
ගන්නොරුව, පේරාදෙණිය,
19703.07.10

8–28—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## පුත්තලම් කච්චේරිය

පුත්තලම් දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973.08.21 වැනි දින දහවල් 12 තෙක්, මුද්‍රා තබන ලද ටෙන්ඩර්, පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාරගනු ලැබේ :—

(1) හලාවත රජයේ නිවාස අළුත් වැඩියා කිරීම.

2. පුත්තලමේ දිසාපති වෙතින් 1973.08.20 වැනි දින පස්වරු 3 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්වල, පිටපත් 2 න් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, අදාළ සියළුම විස්තරද ඔහුගෙන් ලබාගත හැක. රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා ග්‍රාම සංවර්ධන සමිති, සමුපකාර සමිති වැනි අනුමතිය ලත් සමිතිවලටද පමණක් ටෙන්ඩර් කිරීමට අවකාශ ඇත. එක් එක් වැඩට රු. 10 බැගින් වූ ටෙන්ඩර් තැන්පත් මුදලක් වෙනුවෙන් කච්චේරි කුවිතාන්සි ඉදිරිපත් කරන අයට ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති වැනි අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලින් නිදහස් ය.

3. ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ටෙන්ඩර්පත් බහාලන ලියුම් කවරයේ " හලාවත රජයේ නිවාස අළුත්වැඩියා කිරීම " යනුවෙන් සඳහන් කර 1973.08.21 දින දහවල් 12 ට ප්‍රථම පුත්තලමේ දිසාපති වෙත ලැබෙන සේ එවිය යුතුය. මෙදින මෙම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. 1973.08.21 වැනි දින පස්වරු 2 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට ඉඩදෙනු ලැබේ. කොන්ත්‍රාත්තුවේ මුදලින් සියයට පහ (5%) ක් වශයෙන් ගණන් බලන ලද මුදලක් තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඇප වශයෙන් බැඳ ගිවිසුම අත්සන් කළ යුතුය. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට ඒ බැව් දන්වා දින 10 ක් ඇතුළත එසේ කිරීමට ඔහු ඉදිරිපත් නොවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වන්නේ ය.

5. නිම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සීයයට අනූවක් (90%) සඳහා පමණක් මුදල් ගෙවා, ඇප මුදල සමග ඉතිරි සියයට ප්‍රමාණය වැඩ අවසන් කර මාස 3 ක් ඉක්ම ගිය පසු ගෙවනු ලැබේ.

බ. සු. විජේවීර,
පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති.

1973.07.19 වැනි දින,
පුත්තලම කච්චේරියේ දී ය.

8–11—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## හිස් තාර බැරල් මිලයට ගෙන ඉවත් කර ගැනීමේ ටෙන්ඩරය— දකුණු දිසාව

ගාල්ලේ, ප්‍රධාන සිවිල් ඉංජිනේරු සංවිධානයේ, දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් සහ එම පුරවැසියන්ට අයත් වෙළඳ ආයතනයන්ගෙන් දකුණු දිසාව තුල ඇති සියළුම විධායක ඉංජිනේරු කොට්ඨාශ වලින්, හිස් තාර බැරල් මිලයට ගෙන, ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. යම්කිසි කොට්ඨාශයක ඇති හිස් තාර බැරල් සියල්ලම හෝ ඉන් යම්කිසි ප්‍රමාණයක් දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩලවලට සහ එම ප්‍රදේශයේ පදිංචි අයට ගෘහ කර්මාන්ත සඳහා විකිණීමට වැඩ අධ්‍යක්ෂවරයාට සහ/හෝ කොට්ඨාශයේ විධායක ඉංජිනේරුවරයාට බලය ඇත.

2. මගේ කාර්යලයේ හෝ ගාල්ලේ හැර වෙනත් කච්චේරියක හෝ රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර එහි ලදුපත මා වෙත ඉදිරිපත් කළ විට 1973. 08. 24 වැනි දින ප. ව. 3.00 දක්වා ම විසින් ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන අතර 1973. 08. 29 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. 73. 08. 29 වැනි දින පෙ. ව. 11.00 ට ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ.

3. රජයට සිය අභිමතය පරිදි කොන්ත්‍රාත් කාලය මසකින් හෝ ඊට වැඩි කාලයකින් දීර්ඝ කිරීමට ද බලය ඇතිව කොන්ත්‍රාත්තුව හය මසක කාල පරිච්ඡේදයක් සඳහා වේ. ටෙන්ඩර්කරුවන්ගේ මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දිනයේ සිට සති හතරකට වලංගු වනු ඇත.

4. මේ සම්බන්ධව වැඩිදුරටත් විස්තර ගාල්ලේ දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

කේ. වෙල්වරාජා,
වැඩ අධ්‍යක්ෂ වෙනුවට,
දකුණු දිසාව.

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
දකුණු දිසාව,
කොටුව,
ගාල්ල.
1973 ජූලි මස 23 දින දී ය.

8–82—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### ඩීප් ෆ්‍රීසර්ස්, රෙෆ්රිජිරේටර්ස් සහ වෝටර් කූලර්ස් සැපයීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත, තැ. පෙ. 594 හි පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් උපකරණ ළඟ ඇති ගබඩාගයෙන් සැපයීම සඳහා 1973 අගෝස්තු මස 29 වෙනි දින පෙරවරු 10 දතක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

(අ) ඩීප් ෆ්‍රීසර්ස්—ඝන අඩි 12 සහ 16

(ආ) රෙෆ්රිජිරේටර්ස්—ඝන අඩි 6 සහ 8

(ඇ) වෝටර් කූලර්ස්—ගැළුම් 10 සහ 20

ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1973 අගෝස්තු මස 28 වෙනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

පී. ඊ. ඩී. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාධිපති.

8–95—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

**නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය**

පහත දැක්වෙන කල්ක වගී වැලච්චේනෙහි කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය වෙත සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

1. බ්ලීච්ඩ් සල්ෆයිට් පල්ප්—මෙට්‍රික් ටොන් 2000.
2. බ්ලීච්ඩ් සල්ෆේට් පල්ප්—මෙට්‍රික් ටොන් 3000.

(ක්‍රාෆ්ට්)

1973 සැප්තැම්බර් 6 වෙනි දින ප. ව. 2.00 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් කෙරේ. නියෝජිතයින්ගේ නම් සහ ලිපිනයන් සහිතව ලිඛිතව අයදුම් පත් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත් සහ වෙනත් විස්තර ලබාගත හැක.

සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
356, යුනියන් පෙදෙස,
කොළඹ 2.

7-113—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ගමනාගමන මණ්ඩලය**

නො. 200, කිරුළ පාර, නාරාහේන්පිට, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1973 සැප්තැම්බර් මස 5 වෙනි බදාදා පූ. භා. 10 වනතෙක් භාරගනු ලැබේ.

**වැඩ විස්තරය : වතුමුල්ල නව ඩිපෝවේ විදුලි ඉදිකිරීම්**

විදුලි ඉංජිනේරුතැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනු පිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳව අවශ්‍ය සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් පත් යනාදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂාකර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ, රජයේ දෙපාර්තමේන්තුවල විදුලි ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 200,000 හෝ එයට අධික වැයවන කර්මාන්ත සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති.

අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි සඳහා රු. 200 ක මුදලක් ටෙන්ඩර් ඇප මුදල් වශයෙන් ද, ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තු වශයෙන් රු. 25 ක් ද, වේරහැර, ප්‍ර. ගි. නිලධාරිතැන වෙත ගෙවා එම කුවිතාන්සිය 1973 අගෝස්තු මස 31 වෙනි සිකුරාදා දහවල් 12.00 ට පෙර මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

තවද, ටෙන්ඩර්කරුවන් සුදුසුදැයි පරීක්ෂාකිරීම සඳහා ඔවුන්ගේ සහතික පත්‍ර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු වේරහැර, නි.ප්‍ර.ගි.නි. තැන වෙත මුදලින් පමණක් තැන්පත් කළ යුත්තේ එම සහතික පත්‍ර පිළිගනු ලැබුවේ නම් පමණකි.

යාන්ත්‍රික ඉංජිනේරු කොට්ඨාශය,
වේරහැර, බොරලැස්ගමුව,
1973 ජූලි මස 23 දින.

ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු
ලංකා ගමනාගමන මණ්ඩලය.

7-222—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**හම්බන්තොට කච්චේරිය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙහි පහත දැක්වෙන තැනීම් වැඩ සඳහා 1973. 08. 24 වැනි දින පස්වරු 2 දක්වා කොළඹ, තැපැල් පෙට්ටිය අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| වැඩයේ නම | ලියාපදිංචි වියයුතු මුදල |
| --- | --- |
| 1. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ වාහන නවතා තැබීම පිණිස ගරාජයක් ඉදිකිරීම | රු. 55,000 |

2. ඉහත සඳහන් කර ඇති වැඩට ඉදිරියෙන් දක්වා ඇති මුදල් ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත් කරුවන් වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවල ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ට හා අනුමත කරන ලද සංගම්වලටද, 1973. 08. 18 දින පෙරවරු 11 දක්වා හම්බන්තොට දිසාපති විසින් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ලියා පදිංචිය හා අනිකුත් දෑ සනාථ කිරීම සඳහා ලිය කියවිලි ඉදිරිපත් කල යුතුයි.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් හම්බන්තොට කච්චේරියේ ඉහත දැක්වෙන වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා ලද කුවිතාන්සියක් හම්බන්තොට දිසාපති වෙත ඉදිරිපත් කල විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම් හා තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයත් සමිතිවලටද, එම වැඩ සඳහා ඉහත දැක්වෙන මුදල් ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වී තිබේ නම් එකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කල හැකියි. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරන ලද සමිති නිදහස් කරනු ලැබේ. එහෙත් ඉහත වැඩය වෙනුවෙන් දැක්වෙන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් එකී සමිතිවලට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුක්තව ලේඛණ ගත තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් ඉහළ කෙළවරේ වැඩයෙහි නම ලියා තැබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම තැපැලෙන් නො එවන්නේ නම්, ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කල යුතුයි.

5. 1973. 08. 24 දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලියවිල්ලකින් දැන්වූ පසු දින 10 ක් ඇතුලත ගිවිසුම් පත්‍ර අත්සන් කිරීමට හා ඇප මුදල් තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

7. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩකරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයෙන්ම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු එකඟ විය යුතු අතර, ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවගත යුත්තේ වැඩ කරනු ලබන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

8. ජයග්‍රාහී ටෙන්ඩර්කරුට භාරදෙන ලද කොන්ත්‍රාත්තුවේ වැඩ කරගෙන යන අතරතුරදී කොටස් මුදල් ලබාගැනීමට අවශ්‍ය වුවහොත් එවැනි අවස්ථාවලදී කරන ලද වැඩවල තක්සේරු කැරුන වටිනාකමින් සියයට 90 කට සරිලන ප්‍රමාණයේ කොටස් මුදල් ලබාගත හැකියි.

9. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් විස්තර ඇත්නම් හම්බන්තොට දිසාපතිගෙන් විමසීමෙන් ලබාගත හැකියි.

ඩබ්ලිව්. පී. එස්. ජයවර්ධණ,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

1973. 07. 18 වන දින,
හම්බන්තොට දිසාපති කාර්යාලයේදීය.

7-50—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම**

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.—වර්ෂ 1973 සැප්තැම්බර් මස 1 වෙනිද සිට 1974 දෙසැම්බර් මස 31 වෙනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථාන වලට එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—රුපියල් 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වෙලාසනින් එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—එහා මෙහා ගෙන යා යුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරි මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10 ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුව හොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමු වන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. තැන්පත් මුදල.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මවිසින් නියම කරන ලද ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. වෙනත් විස්තර.—තව දුරටත් විස්තර දන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ඒ. බී. එන්. මොහමඩ්,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1973 ජූලි මස 23 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

**උපලේඛනය**

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) මසකට ප්‍රමාණය පයින්ට් | (4) අවසාන දිනය |
|---|---|---|---|
| ගාලු කඩවත් සතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ කාර්යාලයේ සිට ගාලු කඩවත් සතර සෞඛ්‍ය, වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගාල්ල ... | 13,350 | 73.08.28 පෙ.ව. 10 ට |
| උණවටුනේ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | උණවටුන ... | 10,700 | |

8—245—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**කොළඹ රෝහල් මණ්ඩලය—කිළිටි රෙදි සේදීම**

යොමු අංක : සිජ්—8/73

සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.—1974 ජනවාරි මස 01 වැනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වැනිදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් තැන්පත් මුදල්.—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලටද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ මෙවා එවැනි ඉල්ලීම කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයෙහි දහවල් 12 වනතුරු, මෙම කාර්යාලයෙන්ද, ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන් ගෙන්ද, ටෙන්ඩර් පෝරම ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. වත්කමේ විස්තර.—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවටද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් ඒ ලැබුණු බව ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.—මෙහි පෙනෙන උපලේඛනයේ 6 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.—ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ අසල සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින අයදුම්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. තැන්පත් ඇප මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. අනික් විස්තර.—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලැස්වුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.—යම් අවස්ථාවල කිළිටි රෙදි සේදීමට පළමු විෂබීජ නැති කිරීම සඳහා වෙනම ස්ථානයකට ගෙන යාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙන යෑමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන් වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

මා. කාරාලසිංහම්,
කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී වෙනුවට.

කො. රෝ. ම. අධිකාරී කාර්යාලය,
මහ රෝහල, කොළඹ,
1973 ජුලි මස 19 වැනි දින.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් | (3) ඇප මුදල | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | (6) ටෙන්ඩර් භාරගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| 1. උණ රෝහල, අංගොඩ ... ... ... | 100 ... | 400 ... | 4 ... | 2,200 | 1973.08.30 දින පෙරවරු 10 ට |
| 2. රෝගෝපසම නිවාසය, තලගොල්ල, රාගම ... ... | 100 ... | 200 ... | 3 ... | 550 | |
| 3. පිළිකායතනය, මහරගම, i වැනි කොටස, වාට්ටුව ... | 100 ... | 400 ... | 4 ... | 4,500 | |
| 4. පිළිකායතනය, මහරගම, ii වැනි කොටස, ශල්‍යාගාරය ... | 100 ... | 300 ... | 8 ... | 1,800 | |
| 5. කොළඹ කාසල් වීදියේ කාන්තා රෝහලේ දෙවෙනි කොටස, ශල්‍යාගාරය ... ... ... | 100 ... | 300 ... | 10 ... | 5,000 | |
| 6. කොළඹ කාසල් වීදියේ කාන්තා රෝහලේ තුන්වැනි කොටස ළදරු ඒකකය ... ... ... | 100 ... | 400 ... | 12 ... | 18,000 | |
| 7. කොළඹ ද සොයිසා කාන්තා රෝහල, ii වැනි කොටස, ශල්‍යාගාරය | 100 ... | 300 ... | 10 ... | 3,400 | |
| 8. කොළඹ මහරෝහලේ අංක 1 සිට 16, 60, වාට්ටු සහ නිල නිවාස ... | 100 ... | 400 ... | 4 ... | 8,000 | |
| 9. පුනරුත්ථාපන රෝහල, රාගම ... ... | 100 ... | 400 ... | 4 ... | 3,700 | |
| 10. දකුණු කොළඹ මහරෝහල, කලුබෝවිල, දෙහිවල, i වැනි කොටස, අංක 1 සිට 7, 9 හා 11, වාට්ටු, චිකිත්සාගාර, නිල නිවාස ආදිය | 100 ... | 400 ... | 4 ... | 6,500 | |
| 11. දකුණු කොළඹ මහරෝහල, ii වැනි කොටස, අංක 8, 10, 12 හා 15 බී වාට්ටු ... ... ... | 100 ... | 300 ... | දිනපතා ... | 3,000 | |
| 12. දකුණු කොළඹ මහරෝහල, iii වැනි කොටස, අංක 14, 15ඒ, 16, 17, 18 වාට්ටු ... ... ... | 100 ... | 400 ... | දිනපතා ... | 9,000 | |
| 13. දකුණු කොළඹ මහරෝහල, iv වැනි කොටස, ශල්‍යාගාරය ... | 100 ... | 400 ... | දිනපතා ... | 7,000 | |

### ධීවර දෙපාර්තමේන්තුව

ගිණිගත් හේනේ මිරිදිය ධීවර මධ්‍යස්ථානයේ පහත සඳහන් වැඩ සඳහා 1973. 08. 17 වෙනි දින පූ. භා. 10.30 දක්වා ධීවර අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

1. මත්ස්‍ය පෝෂ්‍ය විද්‍යාඥගේ නිවාසයක් තැනීම.
2. ධීවර පරීක්ෂක නිවාසයක් තැනීම.
3. මුරකරු නිවාස දෙකක් තැනීම.
4. මාළු ටැංකියක් (සිමෙන්ති) ලිඳක් සහ ජලාශයක් තැනීම.
5. කාර්යාල ගරාජයක් හා ගබඩාවක් තැනීම.

ටෙන්ඩර් පත්‍ර 1973. 08. 16 වෙනි දින දවල් 12 වන තෙක් ධීවර දෙපාර්තමේන්තුවේ ආයතන ශාඛාවෙන් ලබා ගත හැක. එක් එක් කාර්යය සඳහා ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් 100.

කොළඹ 3, ගාලු මුවදොර,
ධීවර දෙපාර්තමේන්තුවේදී ය.

8-244 —73. 08. 03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා විදුලි බල මණ්ඩලය

### කොළොන්නාවේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්‍යාලය

### ගබඩා සහ ගරාජ තනා භාර දීම

ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්‍යයකර භාරදීම සඳහා 1973 ක් වූ සැප්තැම්බර් මස 10 වන සඳුදා පූ. භා. 10 දක්වා කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540) විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි කොන්ත්‍රාත් සහ සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, ලංකා විදුලි බල මණ්ඩලයේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. තම ලියා පදිංචිය ඔප්පු කරනු ලැබිය හැකි, රුපියල් 1,25,000 කට නොඅඩු ගොඩනැගිලි වැඩ සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ සංයුක්ත මණ්ඩලයන් හි ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා සුදුස්සන් වන්නෝය.

4. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝර්මවලයි. වර්ෂ 1973 ක් වූ සැප්තැම්බර් මස 6 දින දහවල් 2 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වර්ෂ 1973 ක් වූ සැප්තැම්බර් මස 10 දින පූ. භා. 10 ට ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදි ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

එන්. ෂන්මුගරාජා,
ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරු,

තැ. පෙ. 540,
කොළඹ,
1973 අගෝස්තු මස 3 දින.

8-248 —73. 08. 03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ඉප/260 (72/73)

### ගාලු කච්චේරිය

### දැන්වීමයි

ගාලු දිස්ත්‍රික්කයේ පහත උපලේඛණයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1973 අගෝස්තු මස 31 වැනි දින ප.ව. 2 වන තෙක් කොළඹ (තැ.පෙ. 500) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. එම ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාලු මුවදෙර මහලේකම් කාර්යාලයේ තුන්වන තට්ටුවේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු වේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වොක්ත දිසාපති කාර්යාලයේදී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියළු විස්තර ඔහු වෙතින් ලබාගත හැක.

3. රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන දෙපාර්තමේන්තුවල හෝ ගාලු දිසාපති යටතේ ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමුපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට සහ එසේ ලියාපදිංචිවී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට ද, මෙම වැඩ සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියාපදිංචිවී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100/- ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියත් ඉදිරිපත් කළ යුතු වන්නෝය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1973 අගෝස්තු මස 27 වැනි දින ප.ව. 2 දක්වා වන්නේය. ලියාපදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නොවේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළයුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පුළුවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙ "............................ සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් විය යුතු අතර, සියලුම ටෙන්ඩර් පත් අත්සන් තබා සීල් කර, සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුයි.

වයි. ඩබ්. ගුණවර්ධන,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

1973.07.20 වැනි දින,
ගාල්ලේ, දිසාපති කාර්යාලයේ දීය.

### උපලේඛනය

| | වැඩ විස්තරය | | පිහිටි ප්‍රදේශය | | ලියාපදිංචි වී තිබිය යුතු මුදල රු. |
|---|---|---|---|---|---|
| 1. | උඩුවැල්ල ඇල්ල ඉහලපාර | ... | බද්දේගම | ... | 50,000/- |
| 2. | දිවිලානවත්ත ජනපද පාර | ... | අක්මීමන | ... | 25,000/- |
| 3. | හල්විටිගල ජනපදයේ හිනිදුම ජල නල පියවර අළුත්වැඩියාව | ... | හිනිදුම | ... | 40,000/- |
| 4. | කොග්ගල තැපැල් කාර්යාලය | ... | හබරාදුව | ... | 25,000/- |
| 5. | ඌරල අරලියපාර තාර දැමීම | ... | හිනිදුම | ... | 60,000/- |
| 6. | බොරකන්ද පාර තාර දැමීම | ... | අම්බලන්ගොඩ | ... | 25,000/- |

7-88—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

අංකය : ඉප/260(72/73)

**ගාලු කච්චේරිය**

**දැන්වීමයි**

ගාලු දිස්ත්‍රික්කයේ පහත උපලේඛනයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1973 අගෝස්තු මස 31 දින ප. ව. 2 වන තෙක් ගාල්ලේ දිසාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. එම ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාලු දිසාපති කාර්යාලයේ උප දිසාපති ගේ කාර්යාල කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළයුතු වේ.

2. ටෙන්ඩර්පත් ඉදිරිපත් කළයුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබා ගතයුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයේදී බැලිය හැකි වන අතර ඒ පිළිබඳ සියළු විස්තර ඔහු වෙතින් ලබාගත හැක.

3. රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන දෙපාර්තමේන්තුවල හෝ ගාළු දිසාපති යටතේ ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමුපකාර හා ග්‍රාමසංවර්ධන සමිතිවලට සහ එසේ ලියාපදිංචිවී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට ද, මෙම වැඩ සඳහා ඉල්ලුම්කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියාපදිංචිවී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත් රු. 25/-ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1973 අගෝස්තු මස 27 වැනි දින ප. ව. 2 දක්වා වන්නේය. ලියාපදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නොවේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදාල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළයුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පුළුවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ "............... සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් විය යුතු අතර, සියළුම ටෙන්ඩර් පත් අත්සන් තබා සීල් කර, සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුයි.

වයි. ඩබ්. ගුණවර්ධන,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

1973.07.20 දින,
ගාල්ලේ, දිසාපති කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| | වැඩ විස්තරය | පිහිටි ප්‍රදේශය | ලියාපදිංචි වී තිබිය යුතු මුදල |
|---|---|---|---|
| | | | රු. |
| 1. | දන්වලවත්ත ජනපද පාර | හබරාදූව | 10,000 |
| 2. | දම්මල ජනපද ගබඩා සහ ජනපද නිළධාරි කාර්යාලය | හිනිදුම | 2,500 |
| 3. | මැදගම ජනපද නිළධාරි නිවස | හිනිදුම | 2,500 |
| 4. | දම්මල ජනපද නිළධාරිනිවස අළුත්වැඩියා කිරීම | හිනිදුම | 15,000 |
| 5. | පිටුවල තරුණ ව්‍යාපාරයේ ප්‍රවේශපාර අළුත් වැඩියා කිරීම | බෙන්තර ඇල්පිටිය | 3,000 |

7-89—73. 08. 03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව**

මාතලේ දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල ග්‍රාමීය ආරෝග්‍යශාලාවට යන්ත්‍රාගරයක් සැපයීම හා ස්ථාපනය කිරීම

ඉහත සඳහන් සේවය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ විසින් 73.08.17 වැනි දින පෙ.ව. 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් කරුවන් විසින් සැපයීම කළ යුත්තේ තිබෙන තොගයෙනි.

2. 73. 08. 16 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. සියළුම ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "හෙට්ටිපොළ ග්‍රාමීය ආරෝග්‍යශාලාවට යන්ත්‍රාගාරයක් සැපයීම හා ස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම් සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාර දිය යුතුයි.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

6. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයට යම්කිසි වෙනස් වීමක් වේනොත් ඒ බැව් සඳහන් කළ යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුළත් වන්නේ ය.

8. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 73.08.17 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

10. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
73.07.23.

සීපී/2/369

7-86—73. 08. 03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

**මඩම්පැල්ල, කටාන අසල පස් පුරවා පාරක් සකස් කර බොරලු අතුරා සමතලා කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කටාන අසල මඩම්පැල්ල "ඩීකන් සයිඩ්" ස්ථානයට ළඟාවීම සඳහා කියුබ් 102 ක ප්‍රමාණයෙන් යුත් අගල් 12 ක් උසට බොරලු අතුරා පාරක් සකස් කර සමතලා කිරීම, කියුබ් 160 ක ප්‍රමාණයක පස් පුරවා සමතලා කිරීම හා වර්ග අඩි 4,700 ක මතුපිට ප්‍රමාණය සමතලා කොට තබා තිල්ල සකස් කිරීම සඳහා 1973 ක්වූ අගෝස්තු මස 17 වැනි දින පස්වරු 2.00 දක්වා ටෙන්ඩර් භාරගනු ඇත.

කොළඹ 10, ජී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) කාර්යාලයේ දී එදින පස්වරු 2 ට ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්හටද සහභාගි විය හැක.

2. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවා වන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට හා මෙම කාර්ය සතුටුදායක අන්දමින් ඉටු කිරීමට පස් එහා මෙහා ගෙනයාම සඳහා ඩිපර්ස්, ට්‍රැක්ටර් හා ට්‍රේලර් වැනි යන්ත්‍රෝපකරණ තමන් සතුව තිබෙන බව ටෙන්ඩර් කරුවන් විසින් පහත (3) වැනි ඡේදයේ දැක්වෙන පරිදි තැන්පත් මුදල් බැඳීමට පෙර සාර්ථක අයුරින් ඔප්පු කළ යුතුය.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු. 10 ක මුදලත් පහත (4) වැනි ඡේදයේ දක්වා ඇති පරිදි තැන්පත් කර ලබාගත් රිසිට් පත් 1973 අගෝස්තු මස 09 වැනි දින පස්වරු 2.00 ට පෙර ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල හා ටෙන්ඩර් ගාස්තු, කොළඹ ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන දුම්රිය සාමාන්‍ය ගිණුම්කාරි තැන වෙත ගෙවිය යුතුය.

4. ටෙන්ඩර් පෝරම කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ තැ. පෙ. 370 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත)
ලං. දු. දෙ.

තැ. පෙ. 370, කොළඹ 10.
1973 ජූලි මස 25 දින.

8-246 —73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

## තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම

### පොලිස් දෙපාර්තමේන්තුව

**මැෂින් තුවක්කු බුකැට්ටු 2,000ක් සඳහා 1973.6.29 දින විවෘත කරන ලද ටෙන්ඩර්**

1973.6.8 දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද ඉහත සඳහන් සැපයීම පිළිබඳ ටෙන්ඩරය සම්බන්ධයෙන්, ටෙන්ඩර් කරුවන් 6 දෙනෙකු විසින් මිළ ගනන් 6ක් ඉදිරිපත් කරන ලදී.

තෝරාගත් ටෙන්ඩර්කරු පිළිබඳ විස්තර පහත දැක්වේ:—

කේ. එම්. තෝමිස් සිල්වා සහ පුත්‍රයෝ,
27, වේල්ස් කුමාර මාවත,
කොළඹ 14.
භාරගත් මිළ ගණන—එක් මැෂින් තුවක්කු බුකැට්ටුවකට රු. 4.95යි.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

8-228 —73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

### පොලිසි දෙපාර්තමේන්තුව

පහත සඳහන් භාණ්ඩ සඳහා 1973.4.19 වැනි දින විවෘත කළ ටෙන්ඩර්

| භාණ්ඩ | | ලැබුණු ටෙන්ඩර් ගණන | | භාරගත් ඒකක මිළ |
|---|---|---|---|---|
| බොත්තම් (සියළුම වර්ග) | ... | 2 | ... | කිසිවක් නැත |
| තරු (නිලධාරීන්ගේ—මෙස්) | ... | 3 | ... | රු. 1.20 |
| තරු (ලොකු—ක්‍රෝමියම්) | ... | 4 | ... | රු. 1.00 |
| ඔටුනු (නිලධාරීන්ගේ—මෙස්) | ... | 4 | ... | ශත 90 |
| ඔටුනු (මහ සැරයන්ගේ) | ... | 4 | ... | ශත 80 |

තෝරා ගත් ටෙන්ඩර්කරු : එම්. එම්. අන්සාර් මොහිඩීන්, 2, ඔබර්න්සයිඩ් දෙහිවල.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

1973 ජූලි මස 24 වැනි දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේදිය.

8-229 —73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

### අධ්‍යාපන දෙපාර්තමේන්තුව—හලාවත

අබලන් මේස ඔර්ලෝසු 100ක් ද, බිත්ති ඔර්ලෝසු 5 ක් ද, පිත්තල සීනු 25 ක් ද, හලාවත අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 1973 අගෝස්තු 15 වැනි දින පෙරවරු 10.00 ට හලාවත, අධ්‍යාපන කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට ප්‍රථම මෙම භාණ්ඩ බලා සෑහීමකට පත් වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වෙන්දේසිය පිළිබඳ වැඩිපුර විස්තර හලාවත, අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගත හැක.

ඒ. ඇම්. මජීඩ්,
හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

අධ්‍යාපන කාර්යාලය,
හලාවත,
1973. 07. 13 දින,

8-1 —73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

### රේගු වෙන්දේසියක්

පහත සඳහන් බඩු 1973 අගෝස්තු මස 29 වැනි දින පෙරවරු 9.30 ට එෆ්. 2 විකිණීම් ගුදමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම බඩු ගනු කැමැත්තන් විසින් ඒවා 1973 අගෝස්තු මස 28 වැනි දින පෙරවරු 10.00 සිට පස්වරු 3.00 දක්වා පරීක්ෂා කළ හැක.

බඩු මිළට ගත් විගස එහි වටිනාකමින් 50% ක අත්තිකාරම් මුදලක් මිළදී ගත් අය විසින් ගෙවිය යුතුය.

මෙම විකිණීමට අදාළ වෙනත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වැනි දින රජයේ ගැසට් පත්‍රය බලනු මැනවි.

ටී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අංශකැමි වෙනුවට.

මගේ අංකය : පිඹ/විකිණීම්/45/73,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ.

1. පාට රිබන් රෝල් 900—මීටර් 11
2. ඉමිටේෂන් මුදු 312 ක්
3. පෙට්ටියක ග්‍රෝස් 2 බැගින් අඩංගු ඉඳිකටු පෙට්ටි 155 ක්
4. පෙට්ටියක 72 බැගින් අඩංගු නිපල් පෙට්ටි 476 ක්
5. කාඩ් එකක 24 බැගින් අඩංගු ප්ලාස්ටික් බොත්තම් කාඩ් 660 ක්

   කාඩ් එකක 12 බැගින් අඩංගු ප්ලාස්ටික් බොත්තම් කාඩ් 830 ක්
6. රෝල්ඩ් ගෝල්ඩ් කොන්ඩා කටු 205 ක්, කොණ්ඩා කටු 100ක් නෝනාවරුන්ගේ වත්සුනු පෙට්ටි 6 ක්, ඉමිටේෂන් පෙන්ඩන්ට් 48 ක්

   රෝල්ඩ් ගෝල්ඩ් චේන් දුසිම් 13-10/12 ක්

   එකක 72 බැගින් අඩංගු නිකල් චේන් පැකට් 20 ක්, එකක 29 බැගින් අඩංගු නිකල් චේන් පැකට් 1 ක්, කුඩා නිකල් චේන් පැකට් 5 ක්, ඕරෝබ්‍රයිට් වළලු කුට්ටම් 51ක්
7. සෙල්ලම් ඔර්ලෝසු 183 ක්
8. එකක 36 බැගින් අඩංගු සෙල්ලම් නලා පෙට්ටි 62 ක්
9. ප්ලාස්ටික් වළලු කුට්ටම් 40,000 ක්
10. සුප්පු 2,047 ක්
11. කොණ්ඩා කැරළිසිලි 360 ක්, මෙඩල් 225, පිළිම (එකක් කැඩී කෑලි ඇත) 2 ක්, පෙන්ඩන්ට් පැකට් 4 ක්, පෙන්ඩන්ට් (පැකට් නොකළ) 230 ක්, තාලි සෙරප්පු 11 ක්, තෙල් කුට්ටම් 47 ක්, කළුපාට අයිබ්‍රව් පැන්සල් දුසිම් 48 ක්, පාට අයිබ්‍රව් පැන්සල් 40 ක්, (කොන්ඩෙම්) කත්චුක 95 ක්, (කුඩා පබළු ඇල්ලු) කොණ්ඩා කැරළිසිලි 300 ක්, හෙයාර් නෙට් (එකක 12 බැගින්) අඩංගු පැකට් 12 ක්
12. කොණ්ඩා කැරළිසිලි පැකට් 60 ක්
13. ඉලෙක්සල් වළලු කුට්ටම් 216 ක්, ඉලෙක්සල් චේන් කෑලි 44 ක්, ඉමිටේෂන් මුදු 24 ක්, බොරු කොණ්ඩා 19 ක්, ඇස්බැම් ආලේප 285 ක්, ඉමිටේෂන් මුදු 410 ක්
14. එකක පොටවල් හය බැගින් අඩංගු පබළු කැරලි 40 ක්
15. එකක 3 බැගින් අඩංගු කොණ්ඩා කටු කාඩ් 24 ක්, එකක 12 බැගින් අඩංගු කොණ්ඩා කටු කාඩ් 48 ක්
16. 88 වෙළඳ ලකුණ දරන මහතුන්ගේ ඔර්ලෝසු පටි 15 ක්, නෝනා මහතුන්ගේ ඔර්ලෝසු පටි 5 ක්
17. ඉලෙක්සල් චේන් පැකට් 17 ක්, ඉලෙක්සල් චේන් පැකට් 19 ක්, බීඩ් චේන් එකක 12 බැගින් වූ කැරලි 16 ක්, කොණ්ඩා කැරළිසිලි 425 ක්
18. "ඉන්ද්‍රා ඇල්කර්" ඉබි යතුරු 120 ක්, 'වික්ටර්' ඉබි යතුරු 780 ක්, 'ටයිගර්' ඉබි යතුරු 288 ක්, 'රොක්සි' ඉබි යතුරු 360 ක්
19. 'ටයිගර්' ඉබියතුරු 3,360 ක්
20. කැට දෙකක් සහිත කොන්සියුලේට් ක්‍රීඩා උපකරණ 1 ක්, පවිගත කළ කැසට් 1 ක්
21. පාවිච්චි කළ කලිසම් කමිස 4 ක්, පාවිච්චි කළ බ්‍රෙසියර් 1 ක්, පාවිච්චි කළ යට ඇඳුම් 1 ක්, පාවිච්චි කළ ජර්කින් 1 ක්
22. රිස්ලර් සිගරට් කඩදාසි පැකට් 40 ක්
23. සිගරට් කඩදාසි පැකට් 30 ක්
24. රබන් රෝල් 248 ක්
25. සික්වින්ස් පැකට් 11 ක්, කියුටෙක්ස් බෝතල් 22 ක්, සාරි බෝඩර් පැකට් 4 ක්
26. පලුදුවූ මනිපූරි සාරි 2 ක්, හැට්ට රෙද්ද සහිත පලුදුවූ මනිපූරි සාරි 1 ක්
27. පොල් තෙල් ගැලුම් 1 ක්, පොල් තෙල් බෝතල් 2 ක්
28. කටු පැකට් 53 ක්, සුවකෝසයක ඇසුරු ප්ලාස්ටික් කාඩ් 395 ක්, සුවකෝසයක ඇසුරු ප්ලාස්ටික් වළලු කුට්ටම් 1,920 ක්, රත්තල් 18 ක් පමණ බරැති බ්‍රෙසියර් තොග 1ක්
29. සීකෝ අත් ඔර්ලෝසු පටි 22 ක්
30. පලුදුවූ මුද්‍රිත කමිස රෙදි රෝල් 4 ක්
31. එකක 72 බැගින් අඩංගු නිපල් පැකට් 79 ක්, වානේ කටු කටු පැකට් 970 ක්, වයි පොලිතින් මළු 2 ක්, සෝල්ඩරින් ලෙඩ් රෝල් 70 ක්
32. නයිලෝන් නූල් කොන් 3 ක්
33. ඉමිටේෂන් මුදු 18 ක්, මහතුන්ගේ අත් ඔලින්ෂු 4 ක්, පලුදුවූ කපු සරොම් 1ක්
34. හිස් යුරියා මිටි 1 ක්
35. පලුදුවූ කපු සරොම් 3 ක්
36. පැල්ලම් ගැසුනු කපු වේට්ටි 5 ක්, පලුදුවූ ආර්ට් සිල්ක් සාරි 3 ක්, පලුදුවූ කපු සාරි 1 ක්,
37. එකක් ග්‍රෝස් 12 බැගින් අඩංගු ප්‍රෙස් බොත්තම් පැකට් 19 ක්, කැඩුන ඉලෙක්ට්‍රික් ස්විච් 17 ක්, සෙල්ලම් කඩදාසි කුට්ටම් 1 ක්, ඉබි යතුරු 2 ක්, ආරක්ෂිත රේසර් 98 ක්, පවුන්ටන් පෑන් 4 ක්, පෑන් කොටස් 4 ක්
38. රේඩියෝ සම්බන්ධිකරණ වයර් 1 ක්
39. ටී ෂර්ට් 1 ක්
40. ටී ෂර්ට් 2 ක්
41. බෝල් රේසර් 7 ක්, රතුන් පාට වළලු 9 ක්, රිදී පාට වළලු 10 ක්, රෙදි කෑලි 4 ක්, යාර 7 ක්
42. හලර් කොටස් 28 ක්, වැලි කඩදාසි කොළ 28, බීඩි කොළ මිටි 14 ක්
43. පටි 1 ක්
44. මදක් ඉරුනු ස්පෝර්ට්ස් කමිස 1 ක්, 34 ප්‍රමාණයේ අත් දිග බැනියන් 5 ක්, නයිලෝන් මේස් කුට්ටම් 1 ක්, බ්ලේඩ් පැකට් 1ක්
45. (පැල්ලම් ගැසුන) රෝසපාට කොට්ටඋර 4 ක්, (පැල්ලම් ගැසුන) රෝසපාට ඇඳ ඇතිරිලි 2 ක්, පලුදුවූ සුදුපාට කොට්ටඋර 2 ක්, (පැල්ලම් ගැසුන) සුදු සාරි රෙදි යාර 7 1/4 ක් (පැල්ලම් ගැසුන) දොර රෙදි කෑලි 2 යාර 11 ක්, ගොතන වූල් රෝල් 1 ක්, නිල් ගාංචුව සහිත සුවකෝසයක අසුරා ඇත.
46. සිගරට් කඩදාසි පැකට් 212 ක්
47. ඔර්ලෝසු පටි 3 ක්
48. ඔර්ලෝසු පටි 45 ක්
49. ඔර්ලෝසු පටි 2 ක්, ඔර්ලෝසු පටි (පලුදු සහිත) 1 ක්
50. පැල්ලම් ගැසුන ඩැක්රෝන් සාරි 27 ක්
51. පැල්ලම් ගැසුන ඩැක්රෝන් සාරි 29 ක්
52. පලුදුවූ ලේස් සාරි 2 ක්, පලුදුවූ සීතාංශ සාරි 1 ක්
53. සීතාංශ සාරි (පැල්ලම් ගැසුන) 4 ක්
54. නයිලෝන් ජෝජට් සාරි (පැල්ලම් ගැසුන) 3 ක්
55. පැල්ලම් ගැසුන මුද්‍රිත නයිලෙක්ස් සාරි 2 ක්, පැල්ලම් ගැසුනු වැඩදැමූ නයිලෙක්ස් සාරි 4 ක්
56. පාකර් පවුන්ටන් පෑන් 2,817 ක්
57. ටයිගර් ඉබියතුරු දුසිම් 5 ක්
58. පලුදු වූ නයිලෙක්ස් සාරි 1 ක්
59. පෝඩ් සුවකෝසයක දැමූ නයිලෙක්ස් සාරි 1 ක්
60. පෝර්ටික් ඇසිඩ් පොල්කයන් 3 ක්
61. පැල්ලම් ගැසුන රේයන් කමිස රෙදි යාර 3 ක්, පටි 1 ක්, රේයන් කමිස රෙදි කෑලි (නිදර්ශක 1)
62. වේවැල් කුඩ 1 ක්
63. අනුක්‍රමික අංක 70826062 දරණ හාර්ප් පොකට් රේඩියෝ 1 ක්
64. කමිස බොත්තම් ජෝඩු 1 ක්, ලෝහ වළලු කුට්ටම් 8 ක්, සෙල්ලම් එන්ජින් (ප්ලාස්ටික්) 1 ක්, බිත්තියේ එල්ලන පින්තූර 1 ක්, 34 ප්‍රමාණයේ බ්‍රෙසියර් 1 ක්, මහතුන්ගේ බ්‍රීෆ් 2 ක්, ටී ෂර්ට් 1 ක්, නෝනා මහතුන්ගේ බෙල් බොටම් 1 ක්, ළමයින්ගේ කලිසම් 1 ක්, සුදු සැටින් යාර 2 ක්, මුද්‍රිත බතික් යාර 2 1/2 ක්
65. චුවින් ගම් පැකට් 1 ක්, සුකිරි රෝල් 1 ක්
66. වාත්තු යකඩ කුට්ටි කෑලි 5 ක්
67. බීඩි කොළ රාත්තල් 10 ක්
68. බීඩි කොළ රාත්තල් 2 ක්
69. පිර 91 ක්, ස්වර්ණාභරණ සාදන්නන් පාවිච්චි කරන අමතර කොටස් කෑලි 138 ක්

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ රේගුවේ ඒප්. 1 විකිණීම් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1973 අගෝස්තු 15 වෙනි දින පෙ. ව. 9.30 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 අගෝස්තු 14 වැනි දින එම බඩු ගැණුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් 50% ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 දින ගැසට් පත්‍රය බලන්න.

ටී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/1/73
1973 ජූලි මස 20 වන දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. පුද්ගලික බඩුබාහිරාදිය ඇසුරුම් පාර්සල් 3
2. ඖෂධ පෙට්ටි 2
3. රසායන ද්‍රව්‍ය මලු 4
4. රසායනාගාර උපකරණ පෙට්ටි 1
5. වැකුම් බේස් කාර්ටන් 1
6. නාමාවලි (කැටලොග්) පෙට්ටි 1
7. හිස් පෙට්ටි පෙට්ටි 2
8. පයිප්ප වැද්දුම් පෙට්ටි 5
9. කම්බි පොලු නොබැඳි ඇසුරුම් පෙට්ටි 33
10. බැටරි තහඩු පෙට්ටි 1
11. "ඩන්ලොප්" ටයර් (කෑලි 22) [illegible] 1
12. නරක්වූ කලවම් රෙදි නූල් කාටන් 1
13. සනීපාරක්ෂක වැද්දුම් කෑලි 13
14. ප්‍රචාරක පත්‍රිකා පෙට්ටි 1
15. ප්‍රචාරක පත්‍රිකා පෙට්ටි 1
16. බැටරි ආවරණ ඇසුරුම් පෙට්ටි 3
17. විදුලිමය දේ ඇසුරුම් පෙට්ටි 2
18. දොඩම් සාරය පෙට්ටි 10
19. රබර් වළලු පෙට්ටි 1
20. සෙලොපේන් වේප් පෙට්ටි 1
21. මෝටර් රථ අමතර කොටස් පෙට්ටි 1
22. සායම් කුඩු පෙට්ටි 1
23. හිස් බෝතල් කාටන් 2
24. රසායනික ද්‍රව්‍ය කාට්න් 2
25. ග්‍රීස් පීප්ප 2
26. නරක්වූ කලවම් රෙදි නූල් කාටුන් 2
27. බැටරි සෙලමුඩි කාටුන් 4
28. යෝඩින් සිරප් පෙට්ටි 1
29. "ශකුන්තා" ඩී. ඩී. පෙට්ටි 1
30. මෝටර් රථ කොටස් පෙට්ටි 1
31. මුද්‍රිත දේ පෙට්ටි 1
32. රසායනික ද්‍රව්‍ය පෙට්ටි 4
33. ඊවට් පෙට්ටි 1
34. ආගමික ඉගැන්වීම් පොත් පෙට්ටි 3
35. හිස් පීප්ප 1
36. ප්‍රචාරක දේ කාටුන් 1
37. හිස් ප්ලාස්ටික් බෝතල් 4 පෙට්ටි 1
38. අනුදත්ත පෙට්ටි 1
39. fපෝඩ් ක්ලච් සවි කිරීමේ කොටස් පෙට්ටි 1
40. යන්ත්‍ර අමතර කොටස් කෑලි 7
41. තනි තහඩු කෑලි 3
42. යන්ත්‍ර අමතර කොටස් මිටි 1
43. ලෝහ කෑලි 37
44. වායු සෝධක පෙට්ටි 1
45. වේප් ඊයම් සහ වැද්දුම් පෙට්ටි 1
46. "නිෂාම්" සිල්බිම් පෙට්ටි 1
47. "බෙටමෙතසන්" මද්‍යසාර පෙට්ටි 2
48. මෝටර් රථ අමතර කොටස් (ඇලෝක වැද්දුම්) පෙට්ටි 1
49. fපයිබර් ග්ලාස් මැට් රෝල් 8
50. මෝටර් රථ අමතර කොටස් පෙට්ටි 2
51. තනි දුනුතල පෙට්ටි 1
52. අවලංගු කලා
53. මෝටර් රථ අමතර කොටස් (වින්ඩ්ස්ක්‍රීන් ග්ලාස්) පෙට්ටි 1
54. රසායනික ද්‍රව්‍ය මලු 1
55. රසායනික ද්‍රව්‍ය මලු 1
56. තඹ පොලු තොගයක්
57. ඊයම් තහඩු 1
58. ඔපුරෙක්ස් ප්ලේට් 1
59. කඩදාසි රෝල් 1
60. රසායන ද්‍රව්‍ය මලු 5
61. රසායන ද්‍රව්‍ය මලු 2
62. රසායන ද්‍රව්‍ය මලු 28.

8–10—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මඩකලපුව කොට්ඨාශය

ප්‍රයෝජනයට ගත නොහැකි ශීතකරණයන් සහ අතින් ක්‍රියාකරවන පිටපත් කිරීමේ යන්ත්‍රයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1973 අගෝස්තු මස 28 වෙනි දින පෙරවරු 9 ට පහත සඳහන් ශීතකරණයන් සහ අතින් ක්‍රියා කරවන පිටපත් කිරීමේ යන්ත්‍රයක් විකිණීමේ ප්‍රසිද්ධ වෙන්දේසියක් මඩකලපුවේ මහාරෝහලේදී පවත්වනු ලැබේ.

| | |
|---|---|
| 1. ඉංග්‍රීසි විදුලි ශීතකරණ | 1 යි. |
| 2. එල්. ඊ. සී. වර්ගයේ ශීතකරණ (මෝස්තරය ඊ. එන්. ඩබ්. 7/22—1) | 1 යි. |
| 3. අතින් ක්‍රියා කරවන පිටපත් කිරීමේ යන්ත්‍ර (ගෙස්ටෙට්නර් වර්ගය) | 1 යි. |

විකිණීමට තිබෙන මෙම භාණ්ඩයන් 1973 අගෝස්තු මස 27 වෙනි දින පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා මඩකලපුව මහ රෝහලේදී පරීක්ෂා කළ හැක.

එක් එක් භාණ්ඩය වෙන්දේසි කොට අවසන් වූ විගසම මුළු මුදල ගෙවිය යුතු අතර, එම දින පස්වරු 3.30 ට පෙර එකී භාණ්ඩ රෝහල් භූමියෙන් ඉවත් කර ගත යුතුය.

මිළයට ගනු ලැබූ යම් භාණ්ඩයක් ඉහත කී වේලාවට පෙර ඉවත් නොකරන ලදහොත් ඒවා සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

වී. සිංගනායගම්,
මඩකලපුව සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 ජූලි මස 20 වන දින,
මඩකලපුව සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී ය.

8-249 —73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

## මහෙස්ත්‍රාත් උසාවිය—කිලිනොච්චිය

### බඩුබාහිරාදිය විකිණීම

පහත සඳහන් හිමිකරුවන් නොමැති රාජසන්තක කරන ලද භාණ්ඩ 1973 අගෝස්තු මස 17 වැනි දින පෙ. ව. 9.30 ට මෙම උසාවියේදී යාපනය ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්, කේ. සිවරත්නම් මහතා ඉදිරිපිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එදින පෙ. ව. 8.30 සිට පෙ. ව. 9.30 දක්වා විකිණීම සඳහා තිබෙන භාණ්ඩ උසාවියේදී පරීක්ෂා කළ හැක.

බඩු මිලයට ගනු ලබන්නා වෙන්දේසිය අවසානයේ දී එම බඩු වෙන්දේසි කළ ස්ථානයෙන් ඉවත් කරගත යුතුය.

| නඩු නොම්මරය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 7386 | ... | ඩයිනමෝ එකක් සහ බෙල් එකක් සමග රැලේ පා පැදි එකකි.—නො. සීඑෆ්ජ් 2207 |
| 7767 | ... | පා පැදි එකකි, නො. සීඑෆ්ජ්. 13906 |
| ඒ 191/70 | ... | හැන්ඩල් එක සහිත ෆ්‍රේම් එක නො. 10628 ඒ සී, හැන්ඩල් එක සමග ෆ්‍රේම් එක නො. සීඑම්. 71815 |
| ඒ. 241/71 | ... | රැලේ පා පැදි එකකි—නො. ඒඑන්. 44889 |
| ඒ. 266/71 | | හම්බර් පා පැදි එකකි—නො. බීඑම්. 24606 |
| ඒ. 334/71 | ... | රැලේ පාපැදි එකකි—නො. 70 සී 136 |
| 10702 | ... | ලැගේජ් එකක් සහ බෙල් එකක් සහිත රැලේ පා පැදි එකකි—නො. සීඊ. 1866 |
| ඒ. 272/72 | ... | රැලේ පා පැදි එකකි—නො. බීකේ 61756 |
| ඒ. 271/72 | ... | බී. එස්. ඒ. පා පැදි එකකි—ෆ්‍රේම් නො. ඒඩබ්ලිව්. 517 |
| ඒ 277/72 | ... | රැලේ පා පැදි එකකි—ෆ්‍රේම් නො. ඒපී 17746 |
| ඒ. 320/72 | ... | ලැගේජ් එක සහිත රැලේ පා පැදි එකකි—නො. ඒවයි. 19777 |
| ඒ. 16/70 | ... | රිම් එකක් සමග ලොරි ටයර් එකකි-බෙයාරින් නො. 0493 |
| ඒ 329/72 | ... | බොලොක්ක (ගුටකය) එකකි |
| ඒ. 15/70 | ... | ඩාමා වර්ගයේ ඔරලෝසු එකකි—නො. 664541 |
| ඒ. 894 | ... | රෝමර් ඔරලෝසු එකකි |
| ඒ. 174/72 | ... | රත්තරන් වලලු ජෝඩු එකකි |
| 10929 | ... | පිත්තල ලාම්පු එකකි. පිත්තල එල්ලන ලාම්පු එකකි (චූඩාමණි). |

මහෙස්ත්‍රාත්, චාවකච්චේරි.

1973 ජූලි 23 වැනි දින,
චාවකච්චේරිය, මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

7-81 —73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## මහේස්ත්‍රාත් උසාවිය—වවුනියාව

### වෙන්දේසියේ විකිණීමයි

පහත සඳහන් අයිතිකරුවන් නොමැති රාජසන්තක කරන ලද භාණ්ඩ, 1973 අගෝස්තු මස 10 වැනි දින සවස 2 ට අනුරාධපුර ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් ගේ ප්‍රධානත්වයෙන් වවුනියා උසාවියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ දමනු ලබන මෙම භාණ්ඩ මෙදින පෙ.ව. 10 සිට දහවල් 12 දක්වා ප්‍රදර්ශනය කරනු ඇත. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන එම භාණ්ඩ එදින ම උසාවි භූමියෙන් ඉවත් කරගත යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

ඇස්. ආනන්දකුමාරස්වාමි,
මහෙස්ත්‍රාත්, වවුනියාව.

1973 ක්වූ ජූලි මස 17 වැනි දින,
වවුනියාවේ දීය.

| නඩු අංකය | | භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|---|
| 47344 | ... | පනිවිටුවක් |
| එම | ... | එම |
| පීආර්. 156 | ... | එම |
| පීආර්. 108 | ... | එම |
| 47259 | ... | එම |
| — | ... | එම |
| 46933 | ... | ජාරයක් |
| — | ... | ප්ලාස්ටික් ජාරයක් |
| 51579 | ... | එම |
| — | ... | ලොකු ජාරයක් |
| — | ... | පනිවිටුවක් |
| 52006 | ... | හානි වූ කිරි කෑන් එකක් |
| 47822 | ... | ගැලුමේ ටින් එකක් (පරණ) |
| 47819 | ... | ගැලුමේ ටින් එකක් (පරණ) |
| 46525 | ... | පිත්තල කලයක් |
| ඒ.40/16/70–71 | ... | එම |
| පීආර්. 180 | ... | කුඩා පිත්තල කලයක් |
| 51573 | ... | රිදී කොතක් |
| — | ... | කුඩා පිත්තල කෝප්පයක් |
| — | ... | හානි වූ ඇලුමිනියම් කලයක් |
| 47295 | ... | එම |
| ඒ.248/71 | ... | පරණ හානි වූ චිමිනිය නැති ලන්තෑරුමක් |
| — | ... | පරණ හානිවූ ලන්තෑරුමක් |
| — | ... | එම |
| — | ... | එම |
| 47419 | ... | හානි වූ පැට්‍රෝමැක්ස් ලාම්පුවක් |
| | ... | එම |
| 46666 | ... | කේතලයක් |
| 46769 | ... | ලාම්පු කුප්පියක් |
| — | ... | ඉඳුර අගුලු දෙකක් |
| — | ... | ගල් කටු (කොටන) පහක් (5) |
| ඒ.94 | ... | ස්පැනර් එකක් |
| 47643 | ... | බෝතල් ලාම්පුවක බෝතලයක් |
| 45169 | ... | චිමිනියක් |
| 48712 | ... | හිස් ටින් එකක් |
| 46017 | ... | එම |
| 46863 | ... | කුඩා ඉනැමල් බේසමක් |
| — | ... | කුඩා ඉනැමල් කෝප්ප දෙකක් |
| — | ... | ඇඹරුම් ගලක රවුම් ගලක් |
| — | ... | හරිකෙන් ලන්තෑරුමක් |
| — | ... | මේස ලාම්පුවක චිමිනියක් |
| පීආර්. 1 | ... | උදල්ලක් |
| — | ... | පොඩි උදල්ලක් |
| 52142 | ... | උදල්ලක් |
| 46560 | ... | උදල්ලක් |
| ඒ.119/50 | ... | උදල්ලක් |
| 48715 | ... | උදල්ලක් |
| පීආර්. 33 | ... | ගල්කටුවක් |
| 51441 | ... | දිග මිට සහිත කැත්තක් |
| පීආර්. 9 | ... | එම |
| 46048 | ... | එම |
| — | ... | එම |
| — | ... | එම |
| — | ... | එම |
| — | ... | එම |
| — | ... | එම |
| — | ... | එම |
| — | ... | එම |
| 44447 | ... | එම |
| 47304 | ... | පිහියක් |
| 45411 | ... | මන්නා පිහියක් |
| — | ... | පිහියක් |
| — | ... | පිහියක් |
| — | ... | පිහියක් |
| පීආර්. 5 | ... | පිහියක් |
| — | ... | කැත්තක් |
| ඒ.122/73 | ... | රැලේ පාපැදියක් අංක ඊකයූ 2713 |
| ඒ. 125/73 | ... | රැලේ පා පැදියක් අංක සීවයූ 1728 |
| ඒ.14/73 | ... | රැලේ පාපැදියක් අංක ඊර් 322 |
| ඒ.49/73 | ... | හානි වූ පාපැදියක් අංක ඒජේ 94847 |
| 47354 | ... | හර්කියුලස් පා පාදියක් අංක ර් 12168 |
| — | ... | රැලේ පාපැදියක් අංක ඒඊ 80804 |

| නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|
| ඒ.476/69 | ... රලේ පාපැදියක් අංක ඒඑෆ්ජ් 25306 |
| ඒ.8/70 | ... හම්බර් පා පාදියක් අංක ඊපී 1976 |
| 46543 | ... රලේ පාපැදියක් අංක ඩීඑෆ්ජ් 14268 |
| ඒ.47/72 | ... භානි වූ පාපැදියක් අංක බිඒ. 8714 |
| 47822 | ... හර්කියුලස් පාපැදියක් අංක ඩී.බී. 8267 |
| — | ... රලේ බයිසිකල් රාමුවක් අංක ඊබී 272 |
| — | ... රජ් බයිසිකල් රාමුවක් අංක සීඅයි 531 |
| — | ... රලේ බයිසිකල් රාමුවක් අංක ඒඑච් 20285 |
| — | ... රලේ බයිසිකල් රාමුවක් අංක ඩී 220 |
| — | ... රලේ බයිසිකල් රාමුවක් අංක ඒඑම 59250 |
| — | ... ලී සහ වාතේ සහිත බයිසිකල් ලගේජ් කැරියරයක් |
| — | ... පරණ එල්ලන තරාදියක් |
| — | ... කැඩුනු පරණ එල්ලන තරාදියක් |
| — | ... රාත්තල් 1 තරාදි පඩියක් සහ රාත්තල් ½ තරාදි පඩි 2 ක් |
| — | ... දැකැති දෙකක් |
| — | ... හරක් හංවඩු අච්චු පහක් |
| 49181 | ... පරණ රබර් ෂීට් එකක්, හිස් තීන්ත ටින් එකක් සහ පාට්චට් කළ බුරුසුවක් |
| 45602 | ... ඇලුමිනියම් භාජනයක් සහ හිස් ටොෆි ටින් එකක් |
| 46666 | ... කුඩා අත් කියතක් |
| — | ... ට්‍රැක්ටර් රෙස්ට් එකක් |

7-51—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

අංක 28, රොස්මිඩ් පෙදෙස, කොළඹ 7

රෝස්මීඩ් පෙදෙසට මායිම් වූ පර්චස් 38.25 ක ඉඩම සහ ගොඩනැගිලි 1973.08.29 වෙනි දින පෙරවරු 9 ට මගේ කාමරයේදී වෙන්දේසි කරනු ලැබේ.

වැඩි විස්තර, සඳහා මෙහි පහත අත්සන් කල අයගෙන් විමසන්න.

ඊ. එම්. ඒ. තිලකරත්න,
දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්.

දුරකථන අංක : 24610.
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, නව ලේකම් කාර්යාලය, ජනරජ චතුරශ්‍රය, කොළඹ 1.

8-356—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

### නොතාරිස් ආඥපනතේ 7 වෙනි වගන්තිය යටතේ කෙරෙන දැන්වීමයි

පාදුක්කේ මාදොළවාවේ පදිංචි දොන් තෝරිස් මද්දුමගේ වන මම අද සිට පුරා මසක් ගත වූ පසු කොළඹ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන මෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

ඩී. එන්. මද්දුමගේ.

1973. 7. 24.

8-104—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

සලාවත නගරය තුල වට්ටක්කලියේ පදිංචි ආනන්ද ඇනස්ලි මදුරප්පෙරුම වන මම අද දින සිට පුරා මසක් ගතවුනු පසු (සිංහල) නොතාරිස් අවසාන පරීක්ෂණට පෙනී සිටීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාට අයදුම්පතක් ඉදිරිපත් කරන බව මෙයින් දන්වමි.

ආනන්ද ඇනස්ලි මදුරප්පෙරුම.

73. 7. 7.

8-103—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්කේ පෝරේගෙදර පදිංචි, කහඳවල ආරච්චිගේ චන්ද්‍රසේන වන මම වර්ෂ 1973 ක්වූ ඔක්තෝබර් මස පැවැත්වෙන නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අයදුම් පතක් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත ඉදිරිපත් කරන බව 1907 අංක 1 දරන නොතාරිස් ආඥපණතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

කේ. ඒ. චන්ද්‍රසේන.

1973. 7. 20.

8-106—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙර කරණු ලබන නීත්‍යානුකූල දැන්වීමයි

මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර උඩගම්පහ කෝරලේ ගුන්නෑපාන පදිංචි හේනේගෙදරවත්තේ වික්ටර් විජේකෝන් හෙවත් හේනේගෙදරවත්තේ වික්ටර් දවුංඩසේකර විජේකෝන් වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරණ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළුවීම සඳහා ඊට අදාල නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපනතේ 'අ' උපලේඛනයේ හත්වන වගන්තිය අනුව රජයටත් මහජනයාටත් මෙයින් දන්වා සිටිමි.

1973. 07. 14,
ගුන්නෑපාන, පොල්ගොල්ල.

එච්. වී. විජේකෝන්.

8-102—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනීසිටීම සඳහා කෙරෙන නීත්‍යානුකූල දැන්වීමයි

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලේ හඳපාන්ගොඩ පදිංචි ධම්මදාස ජයසිංහ වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1954 වේ නොතාරිස් ආඥපනතේ (සිංහල මුද්‍රණයේ) 7 වගන්තිය යටතේ එම පනතේ 1 උපලේඛනයේ "ආ" කොටසේ 2 ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩී. ජයසිංහ.

73. 7. 4.

8-115—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

බලපිටියේ වැලිවතුගොඩ පදිංචි වතිගමුනි ජේපී මැන්දිස් වන මම අද සිට මාසයක් ඉකුත් වූ පසු බලපිටිය අධිකරණ කොට්ඨාශය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලෙස ඇතුලත් කර ගන්නාමෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපනතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ව. ජේ. මැන්දිස්,

වැලිවතුගොඩ,
බලපිටිය.
1973.7.10.

8-224—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාදා පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

***තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටයක් ... ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු එක කොටසක් ... ... ... | 1 0 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපෑල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින්ම ගෙවිය යුතුය.

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජුලි | 73.07.06 | සිකුරාද | ... | 73.06 27 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07 04 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07 11 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.18 | බදාදා | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07 25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08 08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | අඟහරුවාදා | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.